## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :-11 ශ්‍රේණිය **විෂය** :- : පෙරදිග සංගීතය **අදාළ සතිය :-** ඔක්තෝම්බර් 1 වන සතිය

**2.පාඩම/ ඒකකය:-**.5.1 ශ්‍රී ලංකාවේ චිත්‍රපට ගිත වල නිර්මාණාත්මක අගය තර්කානුකූලව විමසමින් තෝරා ගත් ගීත ගයයි.

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

- තෝරා ගත් චිත්‍රපට ගීත ඇතුලත් ඇමුණුම 01 පත්රිකාව අධ්‍යයනය කරන්න.
- ඒ අනුව නිර්දේශිත කර ඇති චිත්‍රපටි ගීත 11 ශ්‍රේණිය කියවීම් පත්‍රිකාවෙන් හඳුනා ගන්න.
- ඒ අනුව ඔබගේ කැමැත්ත පරිදි ගීතයක් තෝරා ගෙන ඒ පිළිබඳව අධ්‍යයනයක යෙදෙන්න.
- එම ගීතය සොයා ගෙන නැවත නැවත ශ්‍රවණය කරන්න.
- ගීතය ශ්‍රවනය මගින් හොඳින් ධාරණය කරගෙන පුහුණුවීම් කරන්න.
- නැවත ශ්‍රවණය කරමින් තනිව ගැයීමට පුරුදු වන්න.
- ශ්‍රී ලංකාවේ චිත්රපටි සංගිතය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක යෙදෙන්න.

**4.ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි ඉගෙනුම් ආධාරක**

- e - නැණ පියස:- 11 ශ්‍රේණිය
- 11 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත
  e- තක්සලාව -www.e.thaksalawa.mov.gov.lk
  you yube-- https://www.youtube.com/watch?v=FDhQOThLb
  https://www.youtube.com/watch?v=v3JXjjzrxpo
- සිංහල චිත්‍රපට ගීතාවලිය- 1 , 11 මහාචාර්ය සුනිල් ආරියරත්න
- ගාන්ධර්ව අපදාන - මහාචාර්ය සුනිල් ආරියරත්න

**5.අපේක්ෂිත ඉගෙනුම් ඵල:-**

- ➢ ලාංකිය චිත්‍රපට සංගීතය පිළිබඳ තොරතුරු විමර්ශනය කිරීම
- ➢ මෙරට චිත්‍රපට සංගීතඥයින් පෙළ ගස්වයි
- ➢ ජනප්‍රිය චිත්‍රපට ගී ලැයිස්තුගත කරයි
- ➢ තෝරා ගත් නිර්දේශිත චිත්‍රපට ගීයක් ගායනය කරයි.
- ➢ විවිධ සංගීත ශෛලීන්ගෙන් නිර්මිත චිත්‍රපට ගී නම් කරයි.

ඇමුණුම අංක 01

| චිත්‍රපටය හා තිරගතවූ වර්ෂය | අධ්‍යක්ෂණය | සංගීත අධ්‍යක්ෂ | ගී තනු නිර්මාණය | ගීත ප්‍රබන්ධය | ගායක ගායිකාවන් | ඇතුළත් වූ ගීත |
|---|---|---|---|---|---|---|
| සැඩ සුළං | ටී. සෝමසේකරන් | ඇස්. දක්ෂිණ මූර්ති | ආනන්ද සමරකෝන් | ආනන්ද සමරකෝන්<br>ඩී. ටී. ප්‍රනාන්දු | ජමුනා රානි<br>ඒ. එම්. රාජා<br>මොහිදීන් බෙග්<br>ධර්මදාස වල්පොල<br>කේ. රානි සරෝජා<br>පියදාස ගුණසේකර<br>ආනන්ද සමරකෝන්<br>සුනිල් ප්‍රේමසාද<br>ලතා මංගේෂ්කාර් | සිරි දැරු හෙළදිව<br>ජීවනමේ ගමන<br>පෙම් කැකුළ පිපී<br>සැදැවත් උතුම්<br>ඕ එන්න ඕ එන්න<br>ප්‍රීතිවන්න<br>ඉදිරියටා යමු<br>සැවොමා<br>හිස්වී ගියේ ය. |
| රන්මුතුදූව | මයික් විල්සන් | W.D අමරදේව | W.D අමරදේව | චන්ද්‍රරත්න මානවසිංහ | නන්දා මාලිනී,<br>නාරද දිසාසේකර | ගලන ගඟකී<br>පිපී පිපී රේණු<br>පාරමීතා බල |
| ගැටවරයෝ | මයික් විල්සන් | W.D අමරදේව | W.D අමරදේව | මහගම සේකර | අමරදේව<br>නාරද දිසාසේකර<br>ලතා වල්පොල | ආරිච්චි බෝරිච්චි<br>සීත සනත් මැද |
| සත්සමුදුර | මහාචාර්ය සිරි ගුණසිංහ | සෝමදාස ඇල්විටිගල | සෝමදාස ඇල්විටිගල | මහගම සේකර | W.D අමරදේව | සිහිදු සුදුමුතු<br>පිපුණු කුසුම |
| එක්වැම්ගේ | සරත් දසනායක | සරත් දසනායක | | සුනිල් ආරියරත්න | ගුණදාස කපුගේ | උන්මාද සිතුවම් |
| නුලවාලි | සිරි කුලරත්න | වික්ටර් රත්නායක | වික්ටර් රත්නායක | ප්‍රේමකීර්ති ද අල්විස් | බන්දුල විජේවීර<br>සුනිල් එදිරිසිංහ<br>ලතා වල්පොල | කුල ගෙදරින්<br>කුඩාගමේ මද්දහනේ |

**6.ඇගයීම / තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘති :-**

- ලංකාවේ චිත්‍රපට සංගීතය සත්සමුදුර චිත්‍රපටය දක්වා ගොඩ නැගුණ ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
- රේඛාව චිත්‍රපටයේ සිට ලාංකික චිත්‍රපටවල සංගීත නිර්මාණය කල මෙරට සංගීතඥයින් ලැයිස්තුවක් ලියන්න.
- සත් සමුදුර හා රේඛාව චිත්‍රපට ඇතුලත් එකල ජනප්‍රිය වූ චිත්‍ර පට 12ක් පෙළගස්වන්න.
- ජන සංගීතය, භාරතීය සංගීතය, බටහිර සංගීතය ඇසුරින් නිර්මාණය වූ චිත්‍රපට ගී 4ක් බැගින් ලියන්න.
- නිර්දේශිත චිත්‍රපට ගීයක් ගායනය කරන්න.

සැකසුම:- කෑගල්ල අධ්‍යාපන කලාපය